පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.02 පැය 1655 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/623/ 2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**සාර්ථක අත්අඩංගුවට ගැනීම් දෙකක් සම්බන්ධව - අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුව.**

පසුගිය දින කිහිපය තුලදී අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුව මගින් සිදු කරන ලද සාර්ථක වැටලීම් කිහිපයක ප්‍රතිඵල පහත පරිදි හුවා දක්වමි.

01. අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුවේ සමාජ මාධ්‍ය අපරාධ විමශර්න ඒකකය මගින් අන්තජර්ාලය හරහා රුපියල් කෝටි 23 කට ආසන්න BITCOIN හා ETHEREUM CRIPTO මුදල් වංචා කිරීමකට සම්බන්ධ සැකකරුවෙකු හා සැකකාරියක් 2025.04.01 වන දින අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 40 ක් සහ සැකකාරිය වයස අවුරුදු 35 ක් වන වත්තල ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

සැකකරු හා සැකකාරිය කොළඹ ගරු ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු රුපියල් මිලියන 05 බැඟින් වූ ශරීර ඇප දෙකක් මත මුදා හැර ඇති අතර සැකකරුවන්ට විදෙස් ගමන් තහනමක් පනවා ඇත.

02. කාන්තාවන් දෙදෙනෙකුගේ සාමාන්‍ය ඡායාරූප කෘතිම බුද්ධිය Artificial Intelligence මගින් නිරුවත් ආකාරයට සකස් කර ප්‍රචාරණය කිරීමේ සිද්ධින් දෙකකට සම්බන්ධ සැකකරුවෙකු අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුවේ අනුරාධපුර උප ඒකකය මගින් 2025.03.29 වන දින අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 20 ක් වන සාලියපුර, අනුරාධපුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු අනුරාධපුර ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු 2025.04.10 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**